RARE

# පරිසර සංරක්ෂණය හා පාරිසරික සන්නිවේදනයේ නව ප්‍රවණතා

වි.පී. අපේක්ෂා දිල්මිණි
FGS/M/MSSc/2006/29

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 1236 |
| වර්ග අංකය: | |

(සමාජීය විද්‍යාපති ජනසන්නිවේදන උපාධියෙහි අවශ්‍යතාවයක් පූර්ණ කරනු පිණිස කැලණිය විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.)

මාර්තු 2015

# නිබන්ධන සාරාංශය


වර්තමානය වන විට පරිසරය මානව සංහතියේ පැවැත්මට අභියෝග එල්ල කරමින් සිටී. ජනගහන වර්ධනය, පරිසර සම්පත් අධික පරිභෝජනය, පරිසරයට එරෙහි සංවර්ධනය සහ පවතින සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැලසුම් නොමැති වීම හේතුවෙන් ගෝලීය පරිසරය සීඝ්‍රයෙන් දූෂණයට හා හායනයට ලක් වෙමින් පවතී. උද්ගත වී ඇති අහිතකර පාරිසරික තත්ත්වයන් හේතුකොට ගෙන මිනිසාට මුහුණදීමට සිදු වන සමාජ, ආර්ථික හා පාරිසරික හානිය දිනෙන් දින ඉහළ යනු පෙනේ. මෙම පසුබිම තුළ පරිසර සංරක්ෂණය හා තිරසාර සංවර්ධනය සඳහා පාරිසරික සන්නිවේදන කාර්යය වඩාත් ක්‍රියාශීලි ඵලදායී හා අර්ථාන්විත ව සිදු කිරීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. පරිසර සංරක්ෂණයේ හා තිරසාර සංවර්ධනයේ ප්‍රධාන වග කිවයුතු ආයතනය වන පරිසර හා පුනර් ජනනීය බලශක්ති අමාත්‍යාංශය පරිසර සංරක්ෂණ හා තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කරනු ලබන පාරිසරික සන්නිවේදන ක්‍රියාවලියේ ස්වරූපය හඳුනා ගැනීම සඳහා මෙම පර්යේෂණය සිදුකරන ලදි.

පරිසරය යනු කුමක් ද? යන්න 21 වන සියවසයේ පරිසරය සහ මිනිසා, පාරිසරික සංරක්ෂණය, සන්නිවේදන ක්‍රියාවලියේ හැසිරවීම හා පාරිසරික සන්නිවේදනය ස්වභාවය පිළිබඳ ව සාහිත්‍ය කරුණු උපයෝගී කර ගනිමින් මෙහිදී සාකච්ඡා කෙරේ. පරිසරය යන්න, පාරිසරික සන්නිවේදනය යන්න විද්වතුන් විසින් අර්ථ දක්වා ඇති ආකාරය ද ජනගහන වර්ධනය, පරිසර සම්පත් අධික පරිභෝජනය, පරිසරයට එරෙහි සංවර්ධනය සහ පවතින සම්පත් කළමනාකරණය සඳහා විධිමත් සැලසුම් නොමැති වීම හේතුවෙන් උද්ගත වන පාරිසරික අර්බුද පිළිබඳ ව ද විස්තරාත්මක ව සාකච්ඡා කෙරේ.

පරිසර සන්නිවේදනයේ දේශීය ඉතිහාසය පිළිබඳ ව තුන්වන පරිච්ඡේදයේ දී සාකච්ඡා කරනු ලබයි. මෙහිදී ස්වදේශීකත්ව අන්තර්ඥානය, පරිසර තිරසාර සංවර්ධනයක් සඳහා නව මාධ්‍යයන්ගේ දායකත්වය, හරිත ගිණුම්කරණය සහ හරිත වාර්තාකරණ යන පරිසර සංරක්ෂණයේ නව ප්‍රවණතා පිළිබඳ ව අධ්‍යයනය කෙරේ.

පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ මධ්‍යම පරිසර අධිකාරිය පරිසර සංරක්ෂණ හා තිරසාර සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන අධ්‍යාපන හා දැනුවත් කිරීම් වැඩ සටහන් මගින් පාරිසරික සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන ආකාරය ද එම සන්නිවේදන ක්‍රියාවලියට නව මාධ්‍ය භාවිත කරන්නේ ද නැද්ද යන්න අන්තර්ගත විශ්ලේෂණයකින් හා ක්ෂේත්‍ර අධ්‍යයනයක් මගින් සිව්වන පරිච්ඡේදයෙන් ගවේෂණය කරනු ලැබේ. පස්වන පරිච්ඡේදය මගින් පාරිසරික සන්නිවේදනය සඳහා නව මාධ්‍ය භාවිත කළ හැකි විධි ක්‍රම ද යෝජනා කර ඇත.



මුඛ්‍ය පදඃ පරිසරය, පරිසර සංරක්ෂණය, නව මාධ්‍ය, හරිත ගිණුම්කරණය,

හරිත වාර්තාකරණය

Abstract

At present the environment is challenging to the existence of the mankind. Due to lack of formal planning for the resource management, population growth, over consumption of the environmental resources the global environment is being polluted and damaged. Because of these sprung up harmful environmental condition that man has to face is increasing daily. Under this back ground for the protection of the environment and sustainable development at is an essential fact to do the environmental communication task more effectively and more meaningfully. This research was done to identify the nature of the environmental communication process to archive the objectives of the environmental protection and sustainable development of the Ministry of Environmental and Renewable Energy which is the responsible institute.

Here it is discussed what the environment means through the literary facts about the nature of the environmental communication and the behavior of the communication process, environmental protection, man and the environment in the $21^{St}$ century. Not only that I also add how the environment and the environmental communication are defined by the scholars, about the environmental issues due to population growth, over consumption of the environmental resources, development against the environment, the lack of proper planning for the available resources management etc.

In the third chapter it is discussed about the local history of the environmental communication. And also I pay my attention towards inter wisdom of locality, contribution of the new trends for the sustainable development, Green accounting and Green reporting through this study.

In the $4^{TH}$ chapter it is discussed through afield study and analysis how the ministry of environment and renewable Energy, wild life conservation Department and Central Environmental Authority through the education and awareness programmes paying their attention to the process of environmental communication. In the last chapter it is proposed to use the methods of new media for the environmental communication.

Key words: Environment, Environmental conservation, New media,
Green accounting, Green reporting